**සාමාන්‍ය සමය විසිනව වන ඉරුදින** | **දේව ප්‍රකාශන** | 19-10-14

**පළමුවන දේව ප්‍රකාශන** යෙසායා 45:1,4-6

යෙසායා දිවැසිවරයාගේ පොතෙන් ගත් පාඨයෙකි.

**"ජාතීන් යටත් කිරීමටත්, රජවරුන්ගේ බලය බිඳලීමටත්, සමිඳාණෝ සයිරස්ට අභිෂේක කොට පත් කළ සේක."**

සමිඳුන්ගේ අභිෂේක ලත් රජ්ජුරුවෝ සයිරස් ය. ජාතීන් යටත් කිරීමටත්, රජවරුන්ගේ බලය බිඳලීමටත්, සමිඳාණෝ ඔහු සහායට ගත් සේක. නැවත නොවැසෙන පිණිස නගරවල දොරටු සමිඳාණෝ විවෘත ව තබන සේක. එතුමාණෝ සයිරස්ට මෙසේ වදාරන සේක. "මා තෝරාගත් සෙනගක් වන මාගේ සේවක ඉශ්රායෙල්වරුන්ට උපකාර කරන පිණිස මම නුඹ පත් කෙළෙමි. මම සමිඳාණන් වහන්සේ ය. අන් කෙනෙක් නැත. මා හැර අන් දෙවි කෙනෙක් නැත. නුඹ මා නොදන්න නමුත්, මම නුඹ ශක්තිමත් කරන්නෙමි. මා එසේ කරන්නේ, මා හැර අන් දෙවි කෙනෙකු නැති බව නැගෙනහිර සිට බස්නාහිර දක්වා සිටින සියලු දෙනා දැනගන්න පිණිස ය. මම සමිඳාණන් වහන්සේ ය, මා හැර අන් දෙවි කෙනෙක් නැත.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**පිළිතුරු ගීය**

ගීතාවලිය 96:1,3-5, 7-10

**පිළිතුර : ගෞරවය ද බලය ද සමිඳුන් හට පිරිනමන්න.**

**ගීය :** සමිඳුන් හට නව ගීයක් ගයන්න. පොළෝ වැසි සියල්ලෙනි, සමිඳුන් හට ගී ගයන්න. විජාතීන් අතර එතුමන්ගේ මහිමය ප්‍රකාශ කරන්න. ජනතාවන් අතර එතුමන්ගේ ප්‍රබල ක්‍රියා පවසන්න.

සමිඳාණෝ උතුම් ය, අතිශයින් පැසසිය යුතු ය. සියලු දෙවිවරුන්ට වඩා එතුමන්ට ගරුබිය පෑ යුතු ය. ජනතාවගේ සියලු දෙවිවරු පිළිම පමණකි. සමිඳාණෝ ම දෙව් ලොව මැවූ සේක.

සකල ජනයෙනි, සමිඳුන් පසසන්න. ගෞරවය ද බලය ද සමිඳුන් හට පිරිනමන්න. සමිඳුන් නමට හිමි ගෞරවය එතුමන් හට පිරිනමන්න. පඬුරක් රැගෙන එතුමන් ඉදිරියට එන්න. ශුද්ධ සමිඳුන් අබිමුව වැඳ වැටෙන්න. ලෝ වැසි සියල්ලෙනි, එතුමන් අබිමුව බියෙන් ඇලළී සිටින්න.

විජාතීන් අතර මෙසේ පවසන්න. සමිඳාණෝ රජකම් කරන සේක. නොසැලෙන ලෙස ලෝකය පිහිටා ඇත. එතුමාණෝ සාධාරණ ලෙස ජනතාවන් විනිශ්චය කරන සේක.

**දෙවන දේව ප්‍රකාශනය** 1 තෙසලෝනික 1:1-5

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් තෙසලෝනිකවරුන්ට ලියන ලද පළමුවන හසුනේ කොටසකි.

**"ක්‍රියාවෙන් ප්‍රකාෂවන ඇදහිල්ල සිහි කරමු"**

පාවුලු ද සිල්වානස් ද තිමෝතියස් ද යන අපි, දෙව් පියාණන් වහන්සේට සහ ජේසුස් ක්‍රිස්තුස් ස්වාමීන් වහන්සේට අයිති තෙසලෝනිකවරුන්ගේ සභාව වෙත ලියා එවමු. කරුණාව හා ශාන්තිය ඔබට වේවා ! අපේ යාච්ඥාවල දී අපි නිතර ම ඔබ සිහි කරමින්, ඔබ ගැන දෙවියන් වහන්සේට තුති පුදමු. අපගේ දෙව් පියාණන් ඉදිරියෙහි, ක්‍රියාවෙන් ප්‍රකාශ වන ඔබේ ඇදහිල්ල ද, සේවයෙන් දැක්වෙන ඔබේ ප්‍රේමය ද, ඉවසීමෙන් හෙළි වන අපගේ ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ වූ ඔබේ බලාපොරොත්තුව ද අපි සිහි කරමු. දෙවියන් වහන්සේගේ ප්‍රේමණීය සහෝදරවරුනි, උන්වහන්සේ ඔබ තෝරාගත් බව අපි දනිමු. මන්ද, අප සුබ අස්න ඔබ වෙත ගෙනාවේ වචන මාත්‍රයෙන් පමණක් නොව, ශුද්ධාත්ම බලය හා සහතික විශ්වාසය ඇතිව ය. ඔබගේ යහපත උදෙසා අපි ඔබ අතර කෙසේ ජීවත් වීමු දැ යි ඔබ දන්නහු ය.

දේව වාක්‍යය එසේය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**සුප්‍රවත් ජය නද** පිලිප්පි 2:16

ආලේලූයා ! ආලේලූයා !
ජීවන පණිවුඩය ප්‍රදානය කරමින්
අඳුරු ලෝකයක දීප්තිමත් තාරකා මෙන් බබළන්න.
ආලේලූයා !

**ශුද්ධවූ සුවිශේෂය** මතෙව් 22:15-21

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"රජුගේ දේ රජුටත්, දෙවියන් වහන්සේගේ දේ දෙවියන් වහන්සේටත් දෙන්න."**

පරිසිවරු උන්වහන්සේ කට වචනයෙන් අල්ලාගන්නේ කෙසේ දැයි කුමන්ත්‍රණය කළහ. ඔව්හු හෙරෝදිවරුන් සමග තමන්ගේ ශෝලයන් උන්වහන්සේ වෙත යැවූහ. ඔව්හු කතා කොට, "ගුරුදේවයෙනි, ඔබ අවංක කෙනෙකු බවත්, දෙවියන් වහන්සේගේ මාර්ගය හරි ලෙස උගන්වන බවත්, මිනිසුන්ගේ තරාතිරම් නොබලන බැවින් කිසිවෙකු නොතකන බවත් අපි දනිමු. එබැවින් ඔබ සිතන්නේ කුමක් ද? සීසර් අධිරාජයාට අයබදු ගෙවීම යුතු ද අයුතු දැ යි අපට කිව මැනවැ'යි කීහ.

එහෙත්, ජේසුස් වහන්සේ ඔවුන්ගේ නපුරු අදහස දැන, "කෛරාටිකයෙනි, ඔබ මා පරීක්ෂා කරන්නේ මන් ද? බදු ගෙවන කාසියක් මට පෙන්වන්නැ'යි වදාළ සේක. ඔව්හු රිදී කාසියක් ගෙනැවිත් උන්වහන්සේගේ අතට දුන්හ. "මේ රූපය හා සටහන කවරෙකුගේ දැ'යි උන්වහන්සේ ඔවුන්ගෙන් ඇසූ සේක. "සීසර් අධිරාජයාගේ ය'යි ඔව්හු කීහ. එවිට උන්වහන්සේ, "එසේ නම් රජුගේ දේ රජුටත්, දෙවියන් වහන්සේගේ දේ දෙවියන් වහන්සේටත් දෙන්නැ"යි වදාළ සේක.

සමිඳුණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.